# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

## වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) 2009

## 2010 ඔක්තෝබර්/නොවැම්බර්

## BCOM E 2063 – විගණනය

ප්‍රශ්න සංඛ්‍යාව : 05

කාලය : පැය 03 යි

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(01) (අ) විගණනය, ආශ්‍රිත සේවාවන්ගෙන් වෙන් කොට දක්වන්න.

(ලකුණු 05)

(ආ) සමාලෝචන (reviews) එකඟ වූ පිළිවෙත් (agreed-upon procedures) සහ සම්පාදනය (Compilations) සේවා අතර වෙනස හඳුනාගන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 20)

(02) සියළු වෘත්තිකයන් තම සේවාවන්හි තත්වය පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කළ යුතුය.

(අ) විගණකයෙකු තත්ව පාලන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කළ යුත්තේ කුමන මට්ටම් වලදී ද ?

(ලකුණු 02)

(ආ) විගණක සහායකයන්ට තනි තනි විගණන මට්ටමේදි වැඩ පවරන විට විගණකයෙකුට යොදාගත හැකි තත්ව පාලන ක්‍රියාපටිපාටින් කෙටියෙන් පහදන්න.

(ලකුණු 06)

(ඉ) විගණන ආයතනයකට අනුගත කළ හැකි තත්වපාලන ප්‍රතිපත්තිමය අරමුණු සමඟ සම්බන්ධ වන වපසරියන් සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(03) (අ) මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරිමේ අරමුණු කවරේ ද?

(ලකුණු 03)

(ආ) විගණකයෙකුගේ වෘත්තිමය වගකීම් පාලනය කරනු ලබන ආචාර ධර්ම කවරේද ?

(ලකුණු 07)

(ඉ) විගණන අවදානමේ කොටස් තුන විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(04) (අ) වංචා, වැරදි වලින් වෙන් කොට හඳුනා ගන්න.

(ලකුණු 02)

(ආ) ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල විය හැකි විවිධ ආකාරයේ වංචනික ක්‍රියාවන් කෙටියෙන් පහදන්න.

(ලකුණු 06)

(ඉ) විගණනයක් ආරම්භ කිරීමට පෙර විගණකයෙකු විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

(05) පහත සඳහන් ඒවා කෙටියෙන් පහදන්න.

(අ) විගණකයා (The Auditor)

(ආ) සංනිරීක්ෂණය (Vouching)

(ඉ) පුනරාවර්තන විගණන (Recurring audits)

(ඊ) ලේඛනගත කිරීම (Documentation)

(උ) අවංක බව (Integrity)

( මුළු ලකුණු 20)